07

# සලාතයේ වැදගත්කම




ඉස්ලාම් අනිවාර්ය කරන ලද මූලික ඉබාදත් අතරින් සලාතය ප්‍රධාන වේ. එහෙයින්, ඉස්ලාම්, සලාතය මුඃමින්වරයකුගේ ලක්ෂණයක් බවත් මුඃමින් හා කාෆිර් අතර දක්නට ලැබෙන වෙනස බවත් සඳහන් කර ඇත. සලාතය ඉස්ලාමයේ ප්‍රධාන වගකීමක් යන්න, එය අනිවාර්ය කරන ලද ආකාරය තුළින් ද එය ඉටු කරනු ලබන පිළිවෙළ තුළින් ද ගෙනහැර දක්වයි.

## අනිවාර්ය වගකීමකි

සලාතය සෑම ඉස්ලාම් බැතිමතකු ම අනිවාර්යයෙන් ඉටු කළ යුතු "ෆර්ලු අයින්" වන ඉබාදතයකි. "සලාතය (නිවැරදිව) ඉටු කරන්න. නියත වශයෙන් ම සලාතය විශ්වාසීන් වෙත වේලාව නියම කරන ලද වගකීමකි." (4:103) නබි (සල්) තුමාණෝ සලාතය ඉස්ලාමයේ පදනම ලෙස ද එහි කුලුනක් ලෙස ද ගෙන හැර පැවසූහ.

ඉස්ලාමයේ ක්‍රියාකාරකම් අතරින් වැදගත් වන්නේ එහි එක් කුළුණක් වන සලාතය වේ. එහි නාස් ලණුව අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කිරීම වේ.

සලාතය මූලික වගකීමක් ලෙස පිළිගෙන ඉටු නොකරන්නන් හට නබි (සල්) තුමා දැඩි සේ අවවාද කළේ ය. "ජනතාවට නැමදීම උදෙසා අල්ලාහ් හැර සුදුසු වෙන කිසිවකුත් නොමැති බවත් මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දූතයකු බවත් සාක්ෂි දරා, සලාතය ඉටු කර, සකාතය ගෙවන තුරු සටන් කරන ලෙසටත් මට අණ කර ඇත." (බුහාරි) යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.

## විශේෂිත වගකීම

"යමෙක් හට සලාතය මග හැරෙන්නේ ද ඔහු තම පවුල, වස්තුව යනාදිය අහිමි ව සිටින මිනිසකුට සමානය" (ඉබ්නු හිබ්බාන්) යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.

## ඊමානීය ලක්ෂණය


ඊමාන් කරන්නකු හා ඊමාන් නොකරන්නකු අතර වෙනස සලාතය බව නබි (සල්) තුමාණෝ ගෙනහැර දැක්වූහ.

මුඃමින් හා කාෆිර් අතර වෙනස සලාතය අතහැරීම වේ. (මුස්ලිම්)

අප හා ඔවුන් අතර ගිවිසුම සලාතය වේ. කවරෙක් එය අතහරින්නේ ද ඔහු කාෆිර්වරයකු බවට පත් වේ. (ඉබ්නු හිබ්බාන්) යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.

## ජයග්‍රාහී මග

සලාතය ඉටු කිරීම යන්න, බය පක්ෂපාතීත්වයෙන් යුත් භක්තිකයන්ගේ හා ජයග්‍රාහී මුඃමින්වරුන්ගේ මූලික ගුණාංගයක් බව අල් කුර්ආනය ප්‍රශංසා කරයි. (බිය බැති මුඃමින්වරු වන) ඔවුහු සැඟවුණු දේ විශ්වාස කරන්නාහු ය. සලාතය ඉටු කරන්නාහු ය. (2:2-3)



විශ්වාසවන්තයෝ ජයග්‍රහණය ලැබූහ. ඔවුහු තමා සලාතය බිය බැතියෙන් ඉටු කරන්නෝ ය. (23:1-2)

තව ද (ජයග්‍රාහී මුඃමින්වරු වන) ඔවුහු තම සලාතයන්හි සුපරීක්ෂාකාරී ව ඉටු කරන්නෝ ය. (23:9)

ඉහත සඳහන් කරන ලද අල් කුර්ආන් වැකි සලාතයේ වැදගත්කම ගෙන හැර දක්වන්නේ ය. තව ද සලාතය, ජීවිතයේ සෑම පසුබිමක් තුළ ම ඉටු කළ යුතු ය, යන්නට ඉස්ලාම් අනිවාර්යය කර ඇත. එහෙයින් අල්ලාහ් සලාතය උදෙසා අවකාශ රැසක් ලබා දුන්නේ ය. අල් කස්ර් වල් ජම්උ, සලාතුල් කව්ෆ් යනාදිය ඒ අතුරින් වැදගත් ඒවා ය.

අල් කුර්ආනය හා සුන්නාහ්, සලාතය පිළිබඳ ව සඳහන් කරන විට "ඉකාමතුස් සලාත්" සලාතය ඉටු කිරීම " මුහාෆලතුස් සලාත්" සලාතය සුරැකීම යන පද පෙළ භාවිත කර තිබීම විශේෂ ය.

සලාතය නිවැරදි ව ඉටු කරන මුඃමින් මෙලොව හා පරලොව ප්‍රයෝජන රැසක් ලබා ගන්නේ ය. ඒවා නම්,

**1. අල්ලාහ් සමග සංවාදයේ යෙදීම.**

නුඹලා අතරින් කෙනකු සලාතය ඉටු කළේ නම් ඔහු තම රබ් (පරමාධිපති) සමග සංවාදයේ යෙදෙන්නේ ය.

"මම හා මගේ ගැත්තා අතර සලාතය දෙකකට බෙදා ඇත. මගේ ගැත්තාට ඔහුගේ ප්‍රාර්ථනාව ඉටු වේ. ගැත්තා, "අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්" යනුවෙන් පැවසූවේ නම්, අල්ලාහුතආලා "මගේ ගැත්තා මාව සතුටට පත් කළේ ය" යනුවෙන් පවසන්නේ ය. ගැත්තා "අර්රහ්මානිර් රහීම්" යනුවෙන් පැවසුවේ නම්, "මගේ ගැත්තා මා ප්‍රශංසා කළේ ය" යනුවෙන් අල්ලාහ් පවසන්නේ ය. ගැත්තා "මාලිකි යව්මිද්දීන්" යනුවෙන් පැවසූවේ නම්, "මගේ ගැත්තා මා උසස් කළේ ය" යනුවෙන් අල්ලාහ් පවසන්නේ ය. ගැත්තා " ඉයියාක නෑබුදු වඉයියාක නස්තඊන්" යනුවෙන් පැවසුවේ නම්, "මෙය මා හා මගේ ගැත්තා අතර සිදුවන්නකි. ඔහුගේ ප්‍රාර්ථනාව නියත වශයෙන්ම ඔහුට ම ය"යනුවෙන් අල්ලාහ් පවසන්නේය ගැත්තා, "ඉහ්දිනස් සිරාතල් මුස්තකීම් සිරාතල්ලදීන අන්අම්ත අලෛහිම් ගෛරිල් මග්ලූබි අලෛහිම් වලල්ලා ලීන්" යනුවෙන් පැවසුවේ නම්, අල්ලාහ් "මෙය මා හා ගැත්තා අතර සිදුවන්නකි. ඔහුගේ ප්‍රර්ථනාව නියත වශයෙන් ම ඔහුටම ය"යනුවෙන් අල්ලාහ් පවසන්නේය, යැයි නබි (සල්) තුමාණෝ පැවසූහ. (මුස්ලිම්)

**2. අල්ලාහ් සිහිපත් කිරීම හා සැනසුම.**

නුඹ මා නමදිනු. මා සිහිපත් කිරීම පිණිස සලාතය ඉටු කරනු. (20:14)

දැන ගනු, අල්ලාහ් සිහිපත් කිරීමෙන් සිත් සැනසුම ලබන්නේ ය. (13:28)

ඇසේ සිසිලස මගේ සලාතය තුළ ඇති කර ඇත. (බුහාරි)

3. දේව දයාව ලැබීම.

නුඹලා දයාව ලබනු පිණිස සලාතය ඉටු කරනු; සකාත් ගෙවනු; දේව ධර්ම දූතයාට කීකරු වනු. (24:56)

4. ස්වර්ගයේ යතුර.

පරමාන්ත දින ගැත්තකුගෙන් පළමු ව විමසනු ලබන අමල් (ක්‍රියාව) වනුයේ, සලාතය වේ. එය යහපත් නම්, ඔහු ජය ලබන්නේ ය. එය අයහපත් නම්, ඔහු පරාජය වී පාඩු ලබන්නේ ය. (අහමද්)

සලාතයේ යතුර වුළූ වේ. ස්වර්ගයේ යතුර සලාතය වේ. (තිර්මිදි)

5. පරාර්ථකාමී හැඟීම් හා නොසැලෙන සිත.

නියත වශයෙන් මිනිසා නොයිවසිලිවන්තයකු ලෙස නිර්මාණය කර ඇත. ඔහුට නපුරක් සිදු වූ කල්හි, ඔහු නොසන්සුන් ය. ඔහුට යහපතක් සිදු වූ කල්හි, ඔහු මසුරු ය. සලාතය ඉටු කරන අය හැර (අන් සියල්ලෝ ම එලෙස ය) ඔවුහු, ඔවුන්ගේ සලාත්හි නොකඩවා නිරත වෙති. (70:19-23)

6. පාපී ක්‍රියාවන්ගෙන් ආරක්ෂාව.

(නබිවරයාණෙනි!) තව ද, සලාතය ඉටු කරනු! නියත වශයෙන් ම සලාතය ලැජ්ජාශීලී සහගත දේ හා පිළිකුල් සහගත දේ වළකනු ලබයි. අල්ලාහ් මෙනෙහි කිරීම අතිශ්‍රේෂ්ඨ වේ. නුඹලාගේ ක්‍රියා සියල්ල අල්ලාහ් හොඳින් දන්නේ ය. (29:45)

7. පව් කමාව ලැබීම.

දවසේ දෙකෙලවරෙහි දී ද, රාත්‍රී කාලයේ මුල් කොටසෙහි දී ද සලාතයෙහි නිරත වනු නියත වශයෙන් ම, යහපත විසින් අයහපත පහ කරනු ලබයි. මෙය අල්ලාහ් මෙනෙහි කරනවුන්ට හොඳ උපදේශයකි. (11:114)

ෆර්ලු වන සලාතයට අදළ වේලාව පැමිණිය හොත්, නිවැරදි ව වුළූ කර (සලාතය මගින් ඇති කරන්නා වූ) බිය බැතියෙන් හා යටහත්භාවයෙන් (කුෂූඋ, කුලූඋ) සලාතයේ නියැළෙන ඉස්ලාම් භක්තිකයකු සුළු පව් උදෙසා ප්‍රතිකර්මයක් (කෆ්ෆාරා) ලෙස එම සලාතය දිස් වේ. (මුස්ලිම්)

8. පරමාන්න දිනයේ සාක්කියක් වේ.

යමෙකු සලාතය නිවැරදිව සුරකිමින් ඉටු කරන්නේ ද එය ඔහුට පරමාන්න දින ආලෝකයක් ලෙස ද සාක්ෂියක් ලෙස ද ජයග්‍රහණයක් ලෙස ද පවතී. යමෙකු එය අතහැරියේ ද ඔහුට පරමාන්න දින ආලෝකයක් හෝ සාක්ෂියක් හෝ ජයග්‍රහණය හෝ නොලැබේ. නමුත් ඔහු කාරූන්, ෆිර්අවුන්, හාමාන්, උබෙ ඉබ්නු කලබ් යන අය සමග සිටින්නේ ය. (අහ්මද්)

**9. බාහිර - අභ්‍යන්තර පිරිසිදුකම.**

විශ්වාසවන්තයිනි! නුඹලා සලාතය වෙනුවෙන් සූදානම් වූයේ නම්, නුඹලාගේ මුහුණු, වැළමිට දක්වා නුඹලාගේ දෑත්,සෝද ගන්න. තව ද නුඹලාගේ හිස (ජලයෙන් තෙමා) පිරිමැද ගන්න. තව ද වළලුකර දක්වා නුඹලාගේ කකුල ද සෝද ගන්න. අල්ලාහ් නුඹලාට කිසියම් අපහසුතාවක් සිදු වීම ප්‍රිය නොකරන්නේ ය. නමුදු, නුඹලා තුති පිදීම උදෙසා, නුඹලාව පිරිසිදු කරවීමටත් තම දයාද නුඹලා වෙත සම්පූර්ණ කර දීමටත් ප්‍රිය කරන්නේ ය. (5:6)

**10. නිරයේ වේදනාවෙන් ආරක්ෂාව**

ස්වර්ගවාසීන් නිරයේ වැසියන්ගෙන් "නුඹලාව (සකර් නම්) නිරයට ඇතුළු කරනු ලැබුවේ කුමක් ද? " යැයි විමසන්නෝ ය. එයට ඔවුහු "අපි සලාතය ඉටු කරන්නන් අතර නොසිටියෙමු. " යැයි පවසති. (74:40-43)

මේ සියල්ලට ම අමතර ව සලාතය යන්න තනි මිනිසකු සමූහය සමග බන්ධනයක් ඇති කරන ඉබාදතයක් ලෙස ද දක්නට ලැබේ. ගම තුළ රැඳී සිටින පිරමින් වෙත ජමාඅත් වශයෙන් සලාතය ඉටු කිරීම අනිවාර්ය කර තිබීමෙන් දිනකට පස් වරක් ජනතාව සමග සම්බන්ධ වීමේ අවස්ථාවක් හිමි කර ගන්නේ ය.

එහෙයින්, ප්‍රථම වරට අනිවාර්ය කරන ලද, දෙව්ලොව ගමනේ දී ත්‍යාගයක් ලෙස පිරිනැමුණු, පෙර නබිවරුන් වෙත අනිවාර්ය කර තිබුණු, පරමාන්න දින පළමු වරට ප්‍රශ්න කරනු ලබන, නබි (සල්) තුමා විසින් මරණාසන්න මොහොතේ දී සමූහයට වසියියත් කරන ලද වගකීමක් වන සලාතයේ වැදගත්කම ඉගෙන ගෙන, වටහා ගෙන, ඉටු කර, වංචනිකත්වයෙන් වැළකී සත්‍ය මුඃමින්වරයකු ලෙස දෙලොව ම ජය ගැනීමට අදිටන් කර ගනිමු!

**අභ්‍යාස**

01. තනි පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක කරලීමෙහි ලා සලාතයේ වැදගත්කම පහදන්න.

02. සලාතය තුළින් සමාජයට ලැබෙන ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න.

03. සලාතය අත හරින ඔබගේ යහළුවකුට සලාතය අත හැරීමේ විපාක පිළිබඳ ව විස්තර කර ලිපියක් ලියන්න.